# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2476/05 – 2026 පෙබරවාරි මස 16 වැනි සඳුදා – 2026.02.16**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2026 අංක 03 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/13/2023/HA/293.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KIDS/LND/09/ACQ/03/03.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2026 ජනවාරි මස 27 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", අංක 1200/6,
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

උපලේඛනය

I. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, කිරිඇල්ල.

II. **ඉඩමේ විස්තරය.–** සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කිරිඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 145B ඉඩංගොඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඉඩංගොඩ ගමෙහි පිහිටි, සර්වේයර් ජනරාල්ගේ විසින් පිළියෙළ කරන ලද අංකR/KRE/2024/429 හා 2025.04.08 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන කැබලි අක්ෂර 'A' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.6440 ක් පමණ වන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' - බොරලැස්වත්ත - ප්‍රමාණය: හෙක්. 0.6440**

උතුරට සහ නැගෙනහිරට: ගිහාන් ජාලිය බණ්ඩාර හිමිකම් කියන බොරලැස්වත්ත; දකුණට: මාර්ගය (ම.සං.අ.), කිරිඇල්ල ටෙලිකොම් ආයතනය පිහිටි ඉඩම සහ කිරිඇල්ල මධ්‍ය මහා විද්‍යාලය පිහිටි ඉඩම; බටහිරට: කිරිඇල්ල ටෙලිකොම් ආයතනය පිහිටි ඉඩම, ගිහාන් ජාලිය බණ්ඩාර හිමිකම් කියන බොරලැස්වත්ත සහ කිරිඇල්ල මධ්‍ය මහා විද්‍යාලය පිහිටි ඉඩම.

EOG 02 – 0130

1A – G 046305 – 13 (2026/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2026 අංක 04 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/7/2016/HW/03.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: BD/ST/LND/1/7/96.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම පහත සඳහන් උපලේඛනයේ I වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ II වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

2026 ජනවාරි මස 27 වැනි දින.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
“මිහිකත මැඳුර”, ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

උපලේඛනය

I. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.–** ප්‍රාදේශීය ලේකම්, සොරණතොට.

II. **ඉඩමේ විස්තරය.–** ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, සොරණතොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, සොරණතොට කොරළේ සුළු කොට්ඨාසයේ, රිදීපාන 26 C ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උඩලඇල්ලේගම (අ.ග.පි. 88) ගමෙහි පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක B/SRN/2016/87 හා 2021.03.31 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන කැබලි අක්ෂර ‘A’ වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0518 ක් පමණ වන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර ‘A’ - දූන්හිඳ කැලේ - ප්‍රමාණය: හෙක්. 0.0518**

උතුරට: මාර්ගය (මා. සං.අ.) සහ වැවරණ ජයසිංහ ආරච්චිගේ චන්ද්‍රාණි හිමිකම් කියන දූන්හිඳ කැලේ; නැගෙනහිරට සහ දකුණට: වැවරණ ජයසිංහ ආරච්චිගේ චන්ද්‍රාණි හිමිකම් කියන දූන්හිඳ කැලේ; බටහිරට: වැවරණ ජයසිංහ ආරච්චිගේ චන්ද්‍රාණි හිමිකම් කියන දූන්හිඳ කැලේ සහ මාර්ගය (මා.සං. අ.).

EOG 02 – 0131

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.